**ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය - 2016**

**-----------------------------------------------------**

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංවිධානයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත 2017 ජූලි 04 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංවිධානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංවිධානයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය පිහිටුවීම

---

රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සහ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ පාංශු පර්යේෂණ විද්‍යාගාරය යනාදී වෙනත් ආයතන විසින් සිදු කරමින් තිබුණු කාර්යයන් ක්‍රියාත්මක කිරීමට වෙනම ආයතනයක් පිහිටුවීමේ අරමුණින්, 1993 සැප්තැම්බර් 29 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 93/340/173 ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය පිහිටුවා තිබුණි. මෙම සංවිධානය පාර්ලිමේන්තු පනතක් යටතේ සංස්ථාපනය කර නොතිබුණු හෙයින්, එමගින් ඉදිකිරීම් කටයුතු සඳහා නිකුත් කළ සහතිකවල වලංගුභාවය ගැටළුකාරී විය. තවද, අවදානම් සහිත ප්‍රදේශවල සිදු කරනු ලබන ඉදිකිරීම් කටයුතුවලට සම්බන්ධ පුද්ගලයින්ට එරෙහිව පර්යේෂණ සංවිධානය විසින් සිදුකළ යුතු පසුවිපරම් කටයුතු සඳහා පවතින ඉඩකඩ සීමිත වී තිබුණි.

## 1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---

## 2.1 තත්ත්වාගණනය කළ මතය

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

---

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 86 ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශනවල එක් එක් දේපළ පිරියත හා උපකරණ පන්තිය සම්බන්ධයෙන් හෙළිදරව් කළ යුතු කරුණු හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා වූ රු.21,000,000 ක ආදායම් බදු ප්‍රතිපාදනය, මූල්‍ය ප්‍රකාශන වල වෙනම දක්වනු වෙනුවට මූල්‍ය වියදම් වශයෙන් දක්වා තිබුණි.

(ආ) 2016 වර්ෂය සඳහා ගෙවිය යුතු විගණන ගාස්තු වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

## 2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නාය යෑම් අවදානම් තක්සේරු වාර්තා නිකුත් කිරීම වෙනුවෙන් ප්‍රාදේශීය සභා 05 කින් 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා එකතුව රු.630,082 ක් සංවිධානය වෙත ලැබිය යුතුව පැවතුණි. එයින් වර්ෂ 01 ට වඩා පැරණි ශේෂ එකතුව රු.478,690 ක් වූ අතර අදාළ මුදල් කාලීනව අයකර ගැනීමට විධිමත් ක්‍රමවේදයක් සංවිධානය විසින් අනුගමනය කර නොතිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට සංවිධානය වෙත අය විය යුතුව පැවති එකතුව රු,585,727 ක් වූ ටෙන්ඩර් තැන්පතු හා ටෙන්ඩර් ඇප තැන්පතු ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ඉන් රු.414,160 ක ශේෂ වර්ෂ 02 කට වඩා පැරණි විය.

(ඇ) 2009 වර්ෂයේ සිට සංවිධානයේ මූල්‍ය ප්‍රකාශනවල නාගරික සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු ලෙස රු.5,919,636 ක ශේෂයක් අඛණ්ඩව දක්වා තිබුණු නමුත් අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු ශේෂයක් වශයෙන් දක්වා නොතිබුණු බව නිරීක්ෂණය වූයෙන් එම මුදල අයකර ගැනීම අවිනිශ්චිතව පැවතුණි.

(ඈ) 2012 වර්ෂයේ සිට විවිධ ණයගැතියන් යටතේ දක්වා තිබුණු එකතුව රු. 2,495,265 ක් වූ ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) එකතුකළ අගය මත බදු පාලන ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට වර්ෂයකට වඩා කාලයක් ඉක්මවා තිබුණු එකතුව රු.3,803,935 ක් වූ හර ශේෂය හිලව්කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 835 (2) (ඈ) | පර්යේෂණ සංවිධානයේ කාර්යාල පවත්වාගෙනයාම සඳහා පාමංකඩ ප්‍රදේශයේ පිහිටි ගොඩනැගිල්ලක් සමාලෝචිත වර්ෂය තුළදී කුලියට ලබා ගෙන තිබුණ අතර ඒ සඳහා තක්සේරු වාර්තාවක් ලබා ගෙන නොතිබුණි. |
| (ආ) | 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛයේ සඳහන් මූල්‍ය සීමාවන් ඉක්මවීමට අවශ්‍යවන අවස්ථාවලදී ඒ සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ පූර්ව අවසර ලබාගත යුතු වුවද එසේ අවසරය ලබාගැනීමකින් තොරව උපරිම සීමාව ඉක්මවා අවස්ථා 5කදී අත්තිකාරම් ලබා දී තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සංවිධානයේ මූල්‍ය ප්‍රතිඵලය රු.47,920,494 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.53,547,989 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 5,627,495 ක පිරිහීමක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ උපදේශන ආදායම රු. 8,559,890 කින් අඩුවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව නායයෑම් පර්යේෂණ හා අවදානම් කළමනාකරණ අංශය සහ මානව ජනාවාස සැලසුම් සහ පර්යේෂණ අංශය යන අංශ දෙකෙහි පිළිවෙලින් සියයට 83 සහ සියයට 159 කින් ආදායම වැඩිවී තිබුණ නමුත් පරිසර අධ්‍යයන හා සේවා, භූ තාක්ෂණ ඉංජිනේරු හා පර්යේෂණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය යන අංශයන්හි පිළිවෙලින් සියයට 12, සියයට 60 සහ සියයට 62 ක් වශයෙන් ආදායම් පහල ගොස් තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහකිරීමේදී 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මූල්‍ය අතිරික්තයක් ඇති වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික සහ ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීම් කිරීමෙන් පසු 2012 වර්ෂයේ රු.129,665,502 ක්වූ අතිරික්තය 2016 වර්ෂය වන විට රු.335,372,999 දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 4.1 මෙහෙයුම් ක්‍රියාකාරකම්

----------------------------

#### 4.1.1 නායයෑම් අවදානම සම්බන්ධයෙන් තක්සේරු සහතික නිකුත් කිරීම

------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නායයෑම් අවදානම පවතින ප්‍රදේශවල සිදු කරනු ලබන ඉදිකිරීම් සම්බන්ධයෙන් එම ඉදිකිරීම් කරනු ලබන ස්ථානයේ නායයෑම් අවදානම පිළිබඳ තක්සේරු සහතිකයක් නිකුත් කිරීම සංවිධානයේ ප්‍රධාන කාර්යයක් වන අතර මේ සඳහා පර්යේෂණ සංවිධානයේ උපකාර්යාල 9 ක් දිස්ත්‍රික්ක 10 ක් ආවරණය වන පරිදි පිහිටුවා තිබුණි. නායයෑම් අවදානම හඳුනාගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් සෘජුවම ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් අයකිරීමකින් තොරව හා පෞද්ගලික පාර්ශවයන් විසින් සහ පළාත් පාලන ආයතන විසින් කරනු ලබන ඉදිකිරීම් සඳහා වූ ඉල්ලීම් සම්බන්ධයෙන් ගාස්තු අයකර සහතික නිකුත් කරනු ලැබේ. සහතිකපත් නිකුත් කිරීම සම්බන්ධයෙන් බදුල්ල, නුවරඑළිය සහ රත්නපුර දිස්ත්‍රික් කාර්යාලවල සිදුකරනු ලැබූ නියැදි පරීක්ෂණවලදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) සහතික නිකුත් කිරීමට පෙර සිදුකරනු ලබන ක්ෂේත්‍ර පරීක්ෂාව පිළිබඳ නිළධාරීන්ගේ වාර්තා ගොනුගත කර නොතිබීම සහ සහතික සඳහා වූ අයදුම්පත්වල

උප කාර්යාලය විසින් සම්පූර්ණ කළ යුතු කොටස සම්පූර්ණ කර නොතිබීම හේතුවෙන් අදාළ පරීක්ෂණයේ ස්වභාවය සහ වගකිවයුතු නිළධාරීන් හඳුනා ගැනීමට නොහැකි වී තිබුණි. තවද, බදුල්ල දිස්ත්‍රික් කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන විද්‍යාගාරයේ පරීක්ෂණ කටයුතු කම්කරු තනතුරක් දරන අයකු විසින් විධිමත් අධිකාරි බලයකින් තොරව සිදු කර වාර්තා නිකුත් කර තිබුණ බව අනාවරණය විය. මේ හේතුවෙන් පර්යේෂණ සංවිධානය විසින් නිකුත් කරන වාර්තාවල වලංගුභාවය පිලිබඳ සැලකිලිමත් වී නොතිබුණු බව තහවුරු විය.

(ii) අයදුම්පත් ලැබුණු දින සිට සහතිකපත් නිකුත් කිරීම සඳහා මාස 02කට අධික කාලයක් ගතවී තිබුණ අවස්ථා 15 ක් බදුල්ල දිස්ත්‍රික් කාර්යාලයේ සිදුකල නියැදි පරීක්ෂාවේදී හෙළිදරව් විය. සහතික නිකුත් කිරීම සඳහා අවශ්‍යවන වැඩිමනත් තොරතුරු ලබාදීමට අයදුම්කරුවන් විසින් ප්‍රමාද කිරීම හේතුවෙන් මෙම සහතික පත් නිකුත් කිරීම ප්‍රමාද වන බව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විගණනය වෙත පැහැදිලි කර තිබුණි.

(iii) නායයාම් අවදානම් ආවරණය සඳහා පිළියෙල කරන ලද පිරිවැය රු.594,475 ක් වූ ඇස්තමේන්තු 17 ක්, අදාළ පාර්ශවයන් වෙත නිකුත් නොකර මාස දෙකකට අධික කාලයක් ලිපිගොනු තුළ තබාගෙන තිබූ අවස්ථා සහ ක්ෂේත්‍ර පරීක්ෂාව සිදුකිරීමට පෙර පර්යේෂණ සංවිධානය වෙත පෞද්ගලික පාර්ශවයන් විසින් ගෙවිය යුතු මුදල් අයකර නොගෙන ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදුකර තිබූ අවස්ථා 2 ක් නුවර එළිය උප කාර්යාලයේ කටයුතු පරීක්ෂාවේදී අනාවරණය විය. තවද සංවිධානය විසින් භූමි පරීක්ෂණ වාර්තා පිළියෙල කර අදාළ පාර්ශවයන් වෙත නිකුත් නොකර ලිපිගොනු තුළ රඳවා ගෙන තිබුණු අවස්ථා 15 ක්ද නුවරඑළිය උප කාර්යාලයේ නිරීක්ෂණය විය.

(iv) රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 කින් පර්යේෂණ සංවිධානයේ උප කාර්යාලය වෙත 2013 වර්ෂයේ සිට 2016 වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා ලැබී තිබූ ඉල්ලීම් 293 ක් සඳහා 2017 ජනවාරි 18 දින වන විටත් ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. ආපදා කාලවකවානු තුළදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ලැබෙන ඉල්ලීම් පිළිබඳව කඩිනමින් ප්‍රතිචාර දැක්විය යුතු බැවින් අදාළ ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදුකිරීම ප්‍රමාද වූ බව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විගණනය වෙත පැහැදිලි කර තිබුණි.

**4.1.2 නායයාම් අවදානම අවම කිරීම පිළිබඳ කටයුතු**

-----------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යම පළාතේ උස් බිම් වල පිහිටා තිබුණු රජයේ පාසැල් 10 ක් හා රෝහල් 10 ක නායයාමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘති සඳහා රජයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් රු.මිලියන 200 ක ප්‍රතිපාදන සලසාදී තිබුණි. එහෙත් සංවිධානය මගින් සමාලෝචිත වර්ෂය තුළදී නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘති 12 ක් ඉටුකිරීමට සැලසුම් කර තිබුණ අතර එම ව්‍යාපෘති වලින් එක් ව්‍යාපෘතියක් පමණක් මධ්‍යම පළාත තුළ පිහිටා තිබුණි. ප්‍රමාද වී වැඩ ආරම්භ කිරීම හේතුවෙන් ඉන් ව්‍යාපෘති 08ක භෞතික කාර්ය සාධනය 2016 දෙසැම්බර් 31 දිනට සියයට 20 කට වඩා පහළ මට්ටමක පැවතුණි. ඒ අතුරින් බාහිර පාර්ශවයන් වෙත කොන්ත්‍රාත් පිරිනමා තිබුණු ව්‍යාපෘති 06 ක කොන්ත්‍රාත් වටිනාකම ඒවායේ ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකමට වඩා සියයට 3 සිට සියයට 23 ත් අතර පරාසයක් තුළ වැඩිවී තිබුණි.

(ආ) ප්‍රජා මූලික ආපදා අවම කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා 2015 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ රු.11,024,489 ක් පර්යේෂණ

සංවිධානය වෙත ලැබී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු.6,000,000 ක් උපයෝජනය කර තිබුණි. එම මුදලින් ප්‍රජාමූල සංවිධාන සාමාජිකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා රු.18,645 ක් පමණක් වැයකර තිබුණු අතර ඉතිරි රු.5,981,355 ක් සංවිධානයේ ලාභ සහ පොදු කාර්ය වියදම් සඳහා අයකර ගෙන තිබුණි.

(ඈ) පර්යේෂණ සංවිධානය විසින් ක්‍රියාත්මක කර තිබුණු රත්නපුර උඩතලවිටිය නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මෙම ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත්කරුවන් සබරගමුව පළාත් සභාවේ ලියාපදිංචි ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගෙන් සීමිත ලංසු කැඳවීම් මගින් තෝරාගැනීමට තීරණය කර තිබුණ ද, තෝරා ගත් කොන්ත්‍රාත්කරු බස්නාහිර පළාත් සභාවේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවකු විය.

(ii) ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන 2015 වර්ෂය සඳහා වූ රජයේ අයවැය ඇස්තමේන්තුව මගින් සලසාදී තිබුණු නමුත් 2016 ජනවාරි මාසයේදී කොන්ත්‍රාත් කටයුතු ආරම්භ කර තිබුණි. කෙසේ වෙතත්, 2016 මැයි මාසයේදී ඇතිවූ අධික වර්ෂා තත්ත්වය හේතුවෙන් ප්‍රදේශය නායයාමට ලක්වී තිබුණු අතර කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් කටයුතු වලින් ඉවත්ව තිබුණි. මේ සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු සමග අවසන් එකඟතාවයකට පැමිණීමට 2017 මැයි 31 දින වන තෙක් කටයුතු කර නොතිබුණු අතර ඒ අනුව කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණු රු.971,200 ක අත්තිකාරම් මුදල අයකර ගැනීමට නොහැකිව තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු නිසි කාලසීමාව තුළදී ආරම්භ කිරීම මගින් ආපදා අවදානම අවම කිරීම සඳහා පර්යේෂණ සංවිධානයේ අවධානය යොමු වී නොතිබුණු බව විගණනයේදී වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ඈ) නායයාම් අවදානම් පැතිකඩ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ දිස්ත්‍රික්ක 10 ක අවදානම් සිතියම් කරනය, පරිගණක දත්ත ගබඩාවක් ඇති කිරීම සඳහා තොරතුරු රැස්කිරීම, නාගරික ප්‍රදේශ 1: 5000 පරිමාණයට සිතියම්කරණය, දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, යනාදී කටයුතු 2016 වර්ෂයේ සිට 2020 දක්වා සිදුකිරීමට සැලසුම් කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් 02 ක සැලසුම් කළ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා රු.40,000,000 ක ප්‍රතිපාදන රජයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් සලසාදී තිබුණි. කෙසේවෙතත්, 2016 දෙසැම්බර් 31 දිනට බදුල්ල හා නුවරඑළිය දිස්ත්‍රික්කවල සිතියම්ගත කිරීමේ කටයුතු පමණක් සම්පූර්ණ කර තිබුණු අතර ඒ සඳහා රු. මිලියන 30.15 ක මුදලක් උපයෝජනය කර තිබුණි .

(ඉ) ප්‍රජා මූලික පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියක් ස්ථාපිත කිරීමේ කටයුතු පර්යේෂණ සංවිධානය විසින් සමාලෝචිත වර්ෂය තුළදී ආරම්භ කර තිබුණි. මේ සඳහා රු.44,000,000 ක ප්‍රතිපාදන රජයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් සලසා දී තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා ස්වයංක්‍රීය වර්ෂාමාන උපකරණ මිලදී ගැනීමට සැලසුම් කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන තිබුණු වර්ෂාමාන උපකරණ ස්වයංක්‍රීයව ක්‍රියා නොකරන ඒවා බව විගණනයේදී තහවුරු විය. තවද, මෙම වර්ෂාමාන මිලදී ගැනීම සඳහා රු.3,140,000 ක මුදලක් වැයකර තිබුණු බව සඳහන් කර තිබුණු නමුත් මිලදී ගෙන තිබුණු වර්ෂාමානවල වෙළඳපල වටිනාකම රු.487,037 ක් පමණක් වූ බවත්, ඉතිරි මුදල වූ රු. 2,652,963 ක් සංවිධානයේ පොදු කාර්ය වියදම් ප්‍රතිපූර්ණය කරගැනීම සඳහා භාවිතා කර තිබූ බව විගණනයේදී අනාවරණය විය.

(ඊ) බදුල්ල දිස්ත්‍රික්කයේ හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාල බලප්‍රදේශයේ කොට්ටගහඅරාව ප්‍රදේශය නාය යාමේ අවදානම අවම කිරීමේ කටයුතු සම්බන්ධ කොන්ත්‍රාත්තුව පෞද්ගලික පාර්ශවයක් වෙත 2015 ඔක්තෝබර් 06 දින පිරිනමා තිබුණු අතර එම කටයුතු 2016 ජනවාරි 05 දින වන විට නිම කළ යුතුව පැවතුණි. කෙසේ වෙතත්, 2016 ඔක්තෝබර් 05 දින

කොන්ත්‍රාත්කරු අදාළ ඉදිකිරීම් කටයුතු වලින් ඉවත්වී ගොස් තිබුණු අතර ඉදිකිරීම් නිම කිරීම සඳහා පර්යේෂණ සංවිධානය මගින් පියවර ගෙන නොතිබුණි.

මේ සම්බන්ධයෙන් 2016 නොවැම්බර් 30 දින සිදුකළ වැඩ බිම් පරික්ෂාවේදී අදාළ ඉදිකිරීම් සඳහා ප්‍රමිතියෙන් තොර කළු ගල් භාවිතා කර තිබුණු අතර වැලි වෙනුවට ගල් කුඩු පාවිච්චි කර තිබුණු බව අනාවරණය විය. ප්‍රදේශයේ පැවති වැලි හිගය හේතුවෙන් විකල්පයක් වශයෙන් ගල් කුඩු භාවිතා කිරීමට ඉඩදී තිබුණු බව පර්යේෂණ සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් හේතු වශයෙන් දක්වා තිබුණි.

(උ) 2015 සැප්තැම්බර් 17 දින වැඩ ආරම්භ කර තිබුණු මාතලේ දිස්ත්‍රික්කයේ පුස්සල නවෝදයා විද්‍යාලයේ නායයෑම් අවම කිරීමේ කටයුතු 2016 මාර්තු 04 දින වන විට අතරමග නවතාදමා තිබුණි. තවද බදුල්ල දිස්ත්‍රික්කයේ වැවේගම රෝහල් පරිශ්‍රයේ නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු ද 2016 අප්‍රේල් 08 දින වන විට කොන්ත්‍රාත්කරු විසින් නවතා දමා තිබුණි. මේ සම්බන්ධයෙන් පර්යේෂණ සංවිධානය විසින් ගෙවා තිබුණු අත්තිකාරම් මුදල් අයකර ගැනීම සඳහා සහ කාර්යසාධන බැදුම්කර මුදල් කර ගැනීමට කඩිනමින් කටයුතු කර නොතිබුණි. තවද උක්ත ව්‍යාපෘති සඳහා තෝරා ගත් කොන්ත්‍රාත්කරු සුදුසුකම්ලත් කොන්ත්‍රාත්කරුවකු නොවන බව විගණනයේදී හෙළිදරව් විය.

**4.2** **කොන්ත්‍රාත් පරිපාලනය**

-----------------------------

පර්යේෂණ සංවිධානය සඳහා කොළඹ 07 ප්‍රදේශයේ ඉදිකිරීමට යෝජිත ගොඩනැගිල්ල සඳහා, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 වගන්තිය පරිදි මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර නොතිබියදී භාණ්ඩාගාරය විසින් 2015 හා 2016 වර්ෂවලදී එම ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් රු.200,000,000 ක් ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉහත ප්‍රතිපාදනයෙන් උපයෝජනය කර තිබුණේ රු.76,630,000 ක් පමණක් වූ අතර මුළු වියදමින් සියයට 27 ක් නියෝජනය වූ රු.20,505,675 ක් පොදු කාර්ය වියදම් වශයෙන් පර්යේෂණ සංවිධානය විසින්ම අයකර ගෙන තිබුණි.

(ආ) ගොඩනැගිල්ලේ පයිලින් කාර්යයන් සඳහා වූ කොන්ත්‍රාත්තුව රු.45,295,494 ක ඇස්තමේන්තුගත පිරිවැයකට පෞද්ගලික සමාගමක් වෙත ප්‍රදානය කර තිබුණු අතර රු.9,125,808 ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල 2015 දෙසැම්බර් 29 දින නිදහස් කර තිබුණි, කෙසේ වෙතත්, ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණේ 2016 මාර්තු 28 දින මාස තුනක කාල ප්‍රමාදයකින් පසුවය. කොන්ත්‍රාත්තුව පැවරීමෙන් පසු ගොඩනැගිල්ලේ සැලසුම පසුව වෙනස් කිරීම හේතුවෙන් පයිලින් වැඩ සඳහා පිරිවැය රු.66,361,737 ක් දක්වා එනම් සියයට 46 කින් ඉහල ගොස් තිබුණි.

**4.3** **මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පර්යේෂණ සංවිධානය තුළ විශේෂඥ දැනුම පවතින පුද්ගලයින් හිඟව පැවතීම හේතුවෙන් රාජකාරී කාලය ඉක්මවා නිළධාරීන් සේවයේ යොදවා ගැනීමට පියවර ගෙන තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ 4.1 වගන්තිය ප්‍රකාරව අතිකාල ගෙවීමට හිමිකම් නොමැති ශ්‍රේණි වල නිලධාරීන් සඳහා 2016 වර්ෂය තුළදී රු. 6,869,691 ක් අතිකාල දීමනා වශයෙන් ගෙවා තිබුණි.

(ii) 2013 ඔක්තෝබර් 13 දිනැති අංක 21/2013 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන වලට පටහැනිව එක් මාසයක් තුළදී සති අන්ත සහ රජයේ නිවාඩු දිනකට වැඩියෙන් නිලධාරීන් සේවයේ යොදවයි නම් ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතුය. එහෙත් එවැනි අනුමැතියකින් තොරව සංවිධානයේ නිලධාරීන්ට වර්ෂය පුරාම සති අන්ත සහ රජයේ නිවාඩු දිනවල සේවයේ නිරත වීම හේතුවෙන් එකතුව රු. 1,546,020 ක නිවාඩු දින දීමනා සහ ඊට අදාළ සේවක අර්ථ සාධක හා සේවක භාරකාර අරමුදලේ දායකය ලෙස රු.213,093 ක් ගෙවා තිබුණු අතර අදාළ දිනවල විශේෂ රාජකාරී වල නිරත වූ බව සනාථ කර ගැනීම සඳහා සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

(ආ) දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් උපදේශන සේවා සැපයීම සඳහා එම ව්‍යාපෘතිය සමග පර්යේෂණ සංවිධානය 2015 වර්ෂයේදී ගිවිසුමකට එළඹ තිබුණි. එහෙත් සංවිධානයේ රාජකාරීවලට අමතරව ව්‍යාපෘති රාජකාරීවලද නිරතව තිබුණු නිලධාරීන් සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙහි අංක 33 දරන චක්‍රලේඛයේ 1.1 ඡේදයට අනුව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද, ව්‍යාපෘතියේ කටයුතු සඳහා තාක්ෂණික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 9 දෙනකු සහ තාක්ෂණික නොවන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 07 දෙනකු සඳහා දීමනා ගෙවීමට පර්යේෂණ සංවිධානයේ අන්තර් කළමනාකරණ කමිටුවේ අනුමැතිය ලැබී තිබූ නමුත් තාක්ෂණික නොවන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 16 දෙනකු හා තාක්ෂණික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 10 දෙනකු සඳහා දීමනා ගෙවා තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු සඳහා පූර්ණ කාලීනව අනුයුක්ත කර තිබුණු නිලධාරියෙකු වෙත උක්ත චක්‍රලේඛයේ 4.1.1 ඡේදයේ සඳහන් සියයට 50 ක දීමනාව ඉක්මවා රු.333,678 ක් හා අර්ධකාලීනව අනුයුක්ත කර තිබුණ නිලධාරීන් දෙදෙනකු සඳහා චක්‍රලේඛයේ 4.1.3 ඡේදයේ සඳහන් මාසික වැටුපෙන් 1/3 ක දීමනාව ඉක්මවා රු.121,949 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

(ඇ) සංවිධානයේ පාලන අංශය සහ මුදල් අංශ සඳහා අධ්‍යක්ෂවරුන් බඳවා ගැනීමට 2016 අගෝස්තු 18 වන දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන තිබුණද, 2017 මැයි 31 දින වන තෙක් එම තනතුරු සඳහා නිලධාරීන් බඳවාගෙන නොතිබුණු අතර වර්ෂයකට වැඩි කාලයක සිට එම අංශ එකම වැඩ බලන අධ්‍යක්ෂවරයෙකු යටතේ පාලනය වෙමින් පැවතුණි.

(ඈ) පර්යේෂණ සංවිධානය සඳහා අනුමත සේවක සංඛ්‍යාවට විද්‍යාඥ තනතුරු 104 ක් ඇතුළත් වූ නමුත් 2016 දෙසැම්බර් 31 දිනට සේවයේ නියුක්ත ස්ථිර කාර්ය මණ්ඩලයේ වූ විද්‍යාඥයින් සංඛ්‍යාව 77 ක් පමණක් විය. කෙසේ වෙතත්, පැවරුම් පදනම මත විද්‍යාඥයින් 38 දෙනෙකු සහ පුහුණුවන නිලධාරීන් 35 දෙනෙකු සේවයේ යෙදවීමට කටයුතු කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 ක්‍රියාකාරී සැලැස්ම

පර්යේෂණ සංවිධානයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි, අපේක්ෂිත මූල්‍යාමය ඉලක්ක පමණක් දක්වා තිබූ අතර අපේක්ෂිත භෞතික කාර්යසාධන ඉලක්ක ඇතුළත් කර නොතිබුණි. මේ හේතුවෙන්, ආපදා කලාප සිතියම්ගත කිරීම, නායයෑම් අවමකරණය සඳහා සිදුකරනු ලබන ඉදිකිරීම් යනාදිය සම්බන්ධ භෞතික කාර්යසාධනය ඇගයීමට නොහැකි විය.

## 5.2 අභ්‍යන්තර විගණනය

පර්යේෂණ සංවිධානයේ අභ්‍යන්තර විගණන අංශය එක් නිලධාරියෙකුගෙන් සමන්විතව තිබුණු අතර සංවිධානයේ හා දිස්ත්‍රික් කාර්යාලවල විගණන කටයුතු ඉටු කිරීමට අභ්‍යන්තර විගණන කාර්යය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය.

## 5.3 අයවැය පාලනය

අයවැය ලේඛනය සඳහා වූ මූල්‍යමය ඉලක්ක පිළියෙල කිරීමේදී ඒ සඳහා ප්‍රමාණවත් අවධානයක් සහ එම ඉලක්කයන් සපුරා ගැනීම සඳහා ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වා නොතිබුණු අතර 2016 ජූලි මාසය දක්වා වූ සත්‍ය වියදම් හා ආදායම් පදනම් කර ගෙන නැවත සැප්තැම්බර් මාසයේ දී අය වැය ලේඛනය සංශෝධනය කර තිබුණි. මේ හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් උපයෝගී කර නොතිබුණු බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සංවිධානයේ අධ්‍යක්ෂක ජනරාල්ගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ණයගැති පාලනය | දිගුකාලීන හිඟහිටි ශේෂයන් පිළිබඳව පසු විපරම් කටයුතු නොකිරීම හා අයකර ගැනීම. |
| (ආ) | මානව සම්පත් කළමණාකරණය | ප්‍රධාන තනතුරුවල පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම. |
| (ඇ) | ව්‍යාපෘති පරිපාලනය | ඇස්තමේන්තු පිළියෙල කිරීම සහ කොන්ත්‍රාත් පිරිනැමීම ප්‍රමාදයකින් තොරව ඉටුනොකිරීම. |
| (ඈ) | ඉන්වෙන්ට්‍රි පාලනය | ඉන්වෙන්ට්‍රි ලේඛන විධිමත් පරිදි පවත්වා නොගැනීම. |